# 3

# අල්ලාහ් මැවුම්කරුවාය

මිනිසුන් වන අප මැව්වේ කවු ද? අප ජීවත්වන මෙම ලෝකය මැව්වේ කවු ද? පොළවේ ඇති මහමුහුදු, ගංගා, වනාන්තර, කඳු ආදිය මැව්වේ කවු ද? සතුන්, කුරුල්ලන්, මාළුන්, කෘමින් ආදිය මැව්වේ කවු ද?

මේවා  වැදගත් ප්‍රශ්න වන්නේ ය. මේවා මූලික ප්‍රශ්න වන්නේ ය. එම නිසා මෙම ප්‍රශ්න මිනිසුන් සියලු දෙනාගේම හිතේ ඇති වන්නේ ය. මේවාට නිවැරදි උත්තර අප දැනගත යුතු ය.

අප ඉගෙන ගන්න පන්තිය, එහි තිබෙන පුටු, මේස ඉගැන්වීම් උපකරණ ආදිය මෙහි ඉබේම ඇති වුණ ඒවා ද? සැබවින් ම මෙම පාසලත් එහි ඇති පන්ති





කාමරත් ඉදි කළේ ගොඩනැගිලි ඉදිකරන්නන් ය. මෙහි ඇති ලී බඩු සැදුවෝ වඩු බාස්වරු ය. පොත් පත් ලේඛකයන් ලියා මුද්‍රණය කළ ඒවා විය යුතුය.

මෙසේ නොමැතිව ඒවා ඉබේ පහළ වූ ඒවා වන්නේ කෙසේ ද? සැබැවින් ම එය සිදුවිය නොහැකි දෙයකි.

පාන් හදන බේකරියක් ගැන සළකමු. එහි තිරිඟු ඉබේම තිරිඟු පිටි බවට පත්වෙන වා ද? එම පිටිගෝනි යන්ත්‍රවලට ඉබේම වැටෙනවා ද? යන්ත්‍ර ඉබේම ක්‍රියාත්මක වෙනවා පාන් ඉබේ සැදී වැටෙනවා යන්න ඔබ විශ්වාස කරනවා ද?

ඔබගේ නිවසේ කුස්සියේ තේ, බත්, මාළු වැනි ඒවා ඉබේ සෑදෙනවා ද? නැත්නම් දැනුම හා බුද්ධිය ඇති ඔබගේ මව ඒවා සකස් කර ඔබට එවනවා ද? ඔබගේ කෑම මේසයට කෑම ඉබේ පැමිණි බව ඔබගේ මව කීවත්, ඔබ විශ්වාස කරනවා ද? මෙම කටයුතු පියවරෙන් පියවර ක්‍රියාත්මක කිරීමට කෙනෙක් අවශ්‍යයි නේ ද?

මෙයින් අප වටහා ගන්නේ කුමක් ද? ඕනෑම මැවීමක් සඳහා මැවුම්කරුවෙකු සිටිය යුතු ය. මැවුම්කරුවකු නොමැතිව කිසිදු මැවීමක් බිහි වන්නේ නැත. මෙ වැනි ඕනෑම එකක ක්‍රියා ආරම්භ කිරීමට ක්‍රියාකරවන්නකු සිටිය යුතු ය.

එම ක්‍රියා කරවන්නා බුද්ධිමත් අයකු මෙන් ම ශක්තිමත් හා හැකියා ඇති අයකු විය යුතු ය. දැන් මහපොළව දෙස බලන්න. පුළුල් වූ මහසයුර දෙස බලන්න. ඍජුව හා ගාම්භීරව පෙනෙන කඳු දෙස බලන්න. අහසේ පුළුන් මෙන් පාවෙන වලා පෙළ දෙස බලන්න. කැලෑවේ ඇවිදින අලි, ඇතුන්, සිංහයන්, ව්‍යාඝ්‍රයන් දෙස බලන්න. කපුටන්, ගිරවුන්, උකුස්සන් වැනි අහසේ පියාඹන කුරුල්ලන් දෙස බලන්න. බළලුන්, බල්ලන්, ගවයින් වැනි වත්තේ එහා මෙහා යන හුරතල් සතුන් දෙස බලන්න.

මේ සියල්ල ඇත්තෙන්ම දැනුමත් හැකියාවත් ඇති අයෙකු විසින් ම මවා තිබිය යුතු ය. එම මැවුම්කරුවා  අල්ලාහ් ය.

මිනිසුන් වන අපව මෙන් ම අපගේ මුතුන් මිත්තන් යන සියල්ලන් ම මැව්වේ අල්ලාහ් ය. ප්‍රථම මිනිසා වන ආදම් (අලයි)  මැව්වේ අල්ලාහ් ය. ඔහුගේ ඉල ඇටයෙන් හව්වා (අලයි) මැව්වේ ද අල්ලාහ් ය. ඔවුන් දෙදෙනාගෙන් අද දක්වාත්, මතුවටත් මිනිස් පරම්පරාවන් මවන්නේත්  අල්ලාහ්ය. මිනිසා ඇතුළු  අන් සියලුම මැවීම් මැව්වේ අල්ලාහ් යැයි අපි ස්ථිරව විශ්වාස කරමු.

අල්ලාහු හාලිකුනා   අල්ලාහහු රාසිකුනා

අල්ලාහ් හාදීනා   සුබුහාන මව්ලානා

| | |
|---|---|
| අප මැව්වාවූ | අල්ලාහ් |
| අප කුස පුරව | අල්ලාහ් |
| නිසි මග පෙන්වන | අල්ලාහ් |
| පිරසිදුකම හිමි | අල්ලාහ් |

ක්‍රියාකාරකම

1. අහස් තලයේ පියාසර කරන වී කුරුල්ලෙක් දෙස බලන්න. එයට අල්ලාහ් ලබා දී ඇති දායදයන් ලැයිස්තු ගත කරන්න.
2. අල්ලාහ්ගේ මැවුමක් වන මිනිසා සහ ඔහුට සෙවණ ලබා දෙන නුග ගහ අතර පවතින වෙනස ලැයිස්තු ගත කරන්න.